රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 08/94

මගේ අංකය: III/140 එල්/98 ටී/II,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1994.02.07 දින.

සියළුම ලේකම්වරුන් හා,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**අධිකරණ නිලධරයන්/රජයේ නිලධරයන්/රාජ්‍ය සංස්ථා සේවකයින්, රජයේ වාහන පාවිච්චි කිරීම.**

අංක. 264 හා 1984.08.15 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

02. එම චක්‍රලේඛනයේ 04 වන ජේදය වෙනුවට පහත සඳහන් ජේදය ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

04. (අ) එවැනි නාම යෝජනා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්, භාණ්ඩාගාරයේ ලේකම් හා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගෙන් සමන්විත කමිටුවක් විසින් සලකා බලා අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරනු ඇත.

(ආ) මෙම විෂය සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ වරින්වර විමර්ෂණය කොට අවශ්‍ය සංශෝධන අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කිරීමටද ඉහත 04 (අ) ජේදයේ සඳහන් කමිටුව විසින් කටයුතු කරනු ඇත.

(ඇ) පළාත් සභා නිලධාරීන් විසින් රජයේ වාහන පාවිච්චි කිරීම සමාලෝචනය කර අවශ්‍ය සංශෝධන අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කිරීමට ද ඉහත 04 (අ) ජේදයේ සඳහන් කමිටුව විසින් කටයුතු කරනු ඇත.“

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙනිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.